**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2017 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 19 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**---------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

**පහත කරුණු නිරීක්ෂණය විය.**

(අ) ඉකුත් වර්ෂයේ ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කර තිබුණු රු. 451,844 ක් ජ'නල් සටහනක් මඟින් කපා හැරීමේදී මුදල් ගිණුමට හර කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ වෙන්දේසි කරන ලද ඉඩම් වලින් පොදු කටයුතු සඳහා ලැබී තිබූ රු.175,000 ක් වටිනා ඉඩම් කැබලි 03 ක වටිනාකම ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ මිලදීගත් රු.496,000 ක් වටිනා යන්ත්‍රෝපකරණ අයිතම 05 ක් හා රු.1,276,866 ක් වටිනා ලී බඩු හා උපකරණ අයිතම 31 ක් ප්‍රාග්ධනීත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු වෙනුවෙන් ලැබිය යුතු රු.525,247 ක් වූ වරෙන්තු හා දඩ මුදලක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**
**-----------------------------**

**පහත කරුණු නිරීක්ෂණය විය.**

(අ). ගිණුම් විෂයන් 11 කට අදාළව ඉදිරිපත් කර තිබූ උපලේඛනයන් / උපයෝගී පොත් අනුව ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන අනුව වූ ශේෂයන් අතර රු.61,909,107 ක වෙනස්කම් පැවතුණි.

(ආ). සමාලෝචිත වර්ෂය අවසානයට මුළු ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදයම්න් දායක වීමේ ගිණුම අතර රු.1,586,790 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම්**

2014 දෙසැම්බර් මස සිට මාසික බැංකු සැසඳුම් ප්‍රකාශනවල අනාවරණය කරමින් තිබෙන රු.384,602 ක අවිනිශ්චිත ගිණුම හා රු.33,955 ක අගරු චෙක්පත් වශයෙන් සඳහන් වටිනාකම් හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

**පහත කරුණු නිරීක්ෂණය විය.**

(අ). වටිනාකම රු.199,633,143 ක් වූ ඉඩම් ගොඩනැගිලි සඳහා ලේඛන / ඔප්පු/පැවරුම්පත්‍ර ද, රු.61,239,698 ක්වූ ජ'නල් සටහන් 15 ක් සඳහා විස්තර හා උපලේඛනද, රු.279,568,740 ක් වූ වත්කම් හා රු.134,385,829 ක්වූ ණයහිමි සඳහා උපලේඛන, කාලවිශ්ලේෂණ හා යාවත්කාලීන කරන ලද ලේඛන යනාදී සාක්ෂි නොමැතිවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) ඇල්බට් පීරිස් ක්‍රීඩාංගනයේ ඉදිකරන ලද පිහිණුම් තටාකයේ සැලසුම්, ඇස්තමේන්තු ඇතුලත් ලිපි ගොනුව විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

(ඇ) පුරනැගුම ව්‍යාපෘතියට අදාළ බැංකු සැසඳුම් විස්තර විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම**

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (i) 136 වගන්තිය | සභාව සතු බදු දෙන ලද දේපල සම්බන්ධයෙන් රු.4,922,213 ක් වූ වරිපනම් සහ රු.317,967ක් වූ අක්කර බදු අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii)149 වගන්තිය | බලපත්‍ර ගාස්තු මත එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩැනැගීමේ බදු සහ මුද්දර බදු වශයෙන් 2014 සහ 2015 වෙනුවෙන් පිළිවෙලින් රු. 244,780 ක් සහ රු. 214,648 ක් අයකරගෙන නොතිබුණි. |
| (iii) 159(1) වගන්තිය | සභා දේපල කුලියට දීම මත අයවිය යුතු රු.2,273,935 ක් වූ හිඟ කුලිය අයකරගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන ) රීති | |
| (i) අංක 10(8) රීතිය | සභාව සතු දේපල තුනක් අස්ථානගත වීම තුල දේපල සම්බන්ධ සුරක්ෂිතතාවය ආරක්ෂා වන අයුරින් කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) අංක 33 රීතිය | වරිපනම් බදු පැහැර හරින පුද්ගලයන් පිළිබඳව ලැයිස්තුවක් සහ දේපළ තහනම් කිරීමේ වරෙන්තු එක් එක් කාර්තු අවසානයේදී පිළියෙල කර නොතිබුණි. |
| (iii) 42 වගන්තිය | වරිපනම් බදු දැන්වීම් සහ ගෙවීමට අදාල " K " ඉල්ලුම්පත දෙසැම්බර් 31 පෙර බෙදාහැර නොතිබුණි. |
| (iv) 66 වගන්තිය | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (4) අනුව ලේකම්වරයා කටයුතු කර නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

| | |
|---|---|
| 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (ආ) වගන්තිය | සති අන්තයන්හි සහ රජයේ නිවාඩු දිනවල රාජකාරියේ නිරත පැය ප්‍රමාණය ගණනය කරගැනීම සඳහා රාජකාරි අවසන්කල වේලාවන් සටහන් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ, පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.137,039,973 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.37,799,622 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය රු.99,240,351 ක වර්ධනය සඳහා ආදායම් විෂයයන් 5 ක රු.80,127,074 ක වැඩිවීමක් හා වියදම් විෂයයන් දෙකක රු.18,506,935 අඩුවීමක් හේතුවී තිබුණි.

### 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාදේශීය සභාවේ කාරක ප්‍රාග්ධන අනුපාතය 1:4 ක්වූ දුර්වල තත්ත්වයක පැවතුණි.

### 2.4 ආදායම් පරිපාලනය

#### 2.4.1 ආදායම්රැස්කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය අවසානයට රැස්කල යුතු වරිපනම් ආදායමින් සියයට 33 ක්,අක්කර බදු වලින් සියයට 97 ක්,කඩකුලී වලින් සියයට 32 ක් හා බදුකුලී වලින් සියයට 64 ක් අයවී නොතිබුණි.

#### 2.4.2 වරිපනම් බදු

**පහත කරුණු නිරීක්ෂණය විය.**

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බිල් කළ වරිපනම් බදු මුදල වූ රු.9,221,764 න් වර්ෂය තුළදී රැස්කරගෙන තිබුණේ සියයට 80 කට සමාන රු.7,345, 419 ක මුදලක් පමණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට වරිපනම් බදු හිඟය රු.4,922,213 ක් වූ අතර, ආදායම් රැස්කිරීමේ වගකීම ඉටුකර නොතිබෙන තත්ත්වයක් අනාවරණය විය.

**2.4.3 බදු කුලී**

**------------**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.6,537,981 ක්වූ හිඟ මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**2.4.4 වෙනත් ආදායම්**

**------------------**

ආදායම් රැස්කිරීමට අදාල 2015 නොවැම්බර් 06 දිනැති අංක 1940 ගැසට් පත්‍රය ප්‍රකාරව වෙළඳ ප්‍රදර්ශන තාවකාලික කුටි වලින් හා ත්‍රී රෝද නවතා තැබීම සඳහා ගාස්තු අයකරගෙන නොතිබුණි.

**2.4.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**----------------------------**

වයඹ පළාතේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.17,525,533 ක උසාවි දඩ මුදලක් සහ රු.77,457,174 ක මුද්දර ගාස්තු අයවීමට තිබුණි.

**2.4.6 අධිභාර**

**---------**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) වගන්තියේ විධිවිධාන යටතේ වගකිවයුතු අයවළුන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් පනවන ලද අධිභාර අනුව 2016 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණ අධිභාරවල වටිනාකම රු.326,335 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**3.1 කාර්ය සාධනය**

**----------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ). සභාවේ සංවර්ධන සැලැස්ම අනුව ඇස්තමේන්තු අගය රු.19,200,000 ක් වූ ව්‍යාපෘති 07 ක් අත්හැර දමා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ වැඩකටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති 114 කින් 24 ක කටයුතු නිම කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**---------------------------------**

**පහත කරුණු නිරීක්ෂණය විය.**

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.606,033 ක සහ රු.58,617 ක ශේෂ පැවති ජංගම ගිණුම් දෙකක් පිළිවෙලින් 2014 හා 2012 වර්ෂවලින් පසු අක්‍රිය තත්ත්වයට පත්ව තිබුණි.

(ආ) 2014 වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු. 6,390,000 ක්වූ අංක RX-0105 ගලි රථය 2017 අප්‍රේල් 28 දින තෙක් ප්‍රාදේශීය සභාවට පවරාගෙන නොතිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

සභා බල ප්‍රදේශයේ විවිධ කාර්යයන් සඳහා පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර වර්ග 14 ක් විසින් පරිසර පත්‍ර ලබාගෙන නොතිබුණි.

**3.4 හඳුනාගත් අලාභ**

------------------

**පහත කරුණු නිරීක්ෂණය විය.**

(අ) ඉකුත් වර්ෂයේ බිල් කරන ලද රු. 1,877,845 ක් වූ ලැබිය යුතු වරිපනම්, අක්කර බදු හා කඩකුලී ආදායම් සමුච්චිත අරමුදලට කපා හැර තිබුණි.

(ආ) CFL බල්බ් මිලදී ගැනීමෙන් රු.396,360 ක පාඩුවක් සභාවට සිදුවී තිබුණි.

**3.5 කොන්ත්‍රාත් පරිපාලනය**

-------------------------

**වෙන්නප්පුව ඇල්බට් පීරිස් ක්‍රීඩාංගනයේ පිහිනුම් තටාකය ඉදිකිරීම**

-----------------------------------------------------------------

පිහිනුම් තටාකවල සම්මත ගැඹුර පිළිබඳ අධ්‍යයනයකින් තොරව මීටර් 1.7 ක් ගැඹුරු වන පරිදි පස් ඉවත් කිරීමෙන් පසු පිහිණුම් පුහුණු උපදේශකයින්ගේ යෝජනා මත එම ගැඹුර මීටර් 1.35 ක් දක්වා අඩුකිරීම සඳහා නැවත පස් පිරවීමට සභා අරමුදලින් රු.3,242,716 ක් නිෂ්කාර්යව වැයකර තිබුණි.

**3.6 ඝන අපද්‍රව්‍ය කළමණාකරණය**

-------------------------------

**පහත කරුණු නිරීක්ෂණය විය.**

(i) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබූ ඝන අපද්‍රව්‍ය සැලැස්මට අනුව රු.325,000 ක් වූ ක්‍රියාකාරකම් 10 ක් ඉටුකර නොතිබුණි.

(ii) කසළ එකතු කිරීම බල ප්‍රදේශ 5 කට පමණක් සීමා වී තිබුණු අතර, සභා බල ප්‍රදේශය තුල රෝහල් 02 ක් හා විවිධ වර්ගයේ කර්මාන්ත ශාලා විශාල සංඛ්‍යාවක් පැවතියද ඒවායේ කසල එකතු කිරීමක් සිදුව නොතිබුණි.

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

-------------------------------------

**4.1 අයවැය පාලනය**

------------------

**පහත කරුණු නිරීක්ෂණය විය.**

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැයෙහි වැය විෂයයන් ගණනාවක් සම්බන්ධයෙන් ඇස්තමේන්තුගත වෙන් කිරීම් සියයට සියයක් ඉතිරිව තිබුණු අතර සභා බල ප්‍රදේශයේ වෙසෙන මහජනතාවගේ සුභ සාධනය වෙනුවෙන් වැය විෂයයන් 32 ක්සඳහා වෙන් කර තිබූ රු.4,150,000 ක ප්‍රතිපාදන ඉතිරිවී හෝ වෙනත් වැඩ විෂයයන් වලට මාරුකර තිබූ බැවින් අදාල සේවාවන් කිසිවක් සිදුකර නොතිබුණි.

(ආ) ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කර තිබුණු රු.85,900,000 කින් රු.59,420,000 ක් ඉතිරිව තිබුණි. එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 70 ක ප්‍රමාණයක් විය.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**--------------------------------**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.21 වගන්තිය අනුව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.3 අභ්‍යන්තර විගණනය**

**--------------------------**

මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.

**4.4 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්**

**----------------------------------------------------**

ඉකුත් වර්ෂයේ දී හඳුනාගත් පහත දැක්වෙන අලාභ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

i. සභාව සතු රු. 156,550 ක් වටිනා කොන්ක්‍රීට් මිශ්‍රණය අස්ථානගත වී තිබීම.
ii. සභාව සතු වත්කම් බාහිර පාර්ශවයන්ට නොමිලේ පවරා දීමෙන් සිදුවූ රු.255,000 ක පාඩුව
**iii.** අස්ථානගත වූ රු. 177,100 ක් වටිනා ගැලවනයිස් බට 161

**5. පද්ධති හා පාලන**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන දූර්වලතා සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කෙරේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | ඉඩම් හා ගොඩනැගිලි ඇතුළුව අදාල ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන පවත්වා නොතිබුණි. |
| (ආ) | තොග පාලනය | තොග ලෙජරයේ පවතින ශේෂයන් ගිණුම්වලට ගෙන ඒමේදී අත්හැරීම් සිදුවී තිබුණි. |
| (ඇ) | ණයහිමියෝ | විවිධ ණයහිමි හා වෙනත් බැරකම් හඳුනාගත හැකි පරිදි ලේඛන නඩත්තු කර නොතිබුණි. |
| (ඈ) | කොන්ත්‍රාත් පරිපාලනය | ඉලක්කගත කොන්ත්‍රාත් විශාල ප්‍රමාණයන් සිදුකර නොතිබුණි. |
| (ඉ) | අයවැය පිළියෙල කිරීම | සමාලෝචිත වර්ෂය සඳහා බොහෝ මහජන සුභසාධන කටයුතු හා ප්‍රාග්ධන ඉදිකිරීම සිදු |

| | | |
|---|---|---|
| | | කර නොතිබුණු අතර, අනවශ්‍ය පරිදි ප්‍රතිපාදන ඇති කර තිබුණි. |
| (ඊ) | ගිණුම්කරණය | ප්‍රාදේශීය සභා රීතිවලට අනුව පිළියෙල කරනු ලබන ප්‍රා.ස. වාර්තා කාලීනව පිළියෙල කිරීම, පරීක්ෂා කිරීම, අධීක්ෂණය හා ගිණුම් අංශය වෙත නිවැරදි වාර්තා යොමු කිරීම සිදුකර නොමැති බව නිරීක්ෂණය විය. |
| (උ) | කසළ කළමනාකරණය | සභා බල ප්‍රදේශයේ රෝහල් හා කර්මාන්තශාලා වලින් බැහැර කරන කසළ සහ බල ප්‍රදේශයේ කලාප 07 ක කසල සමඟ දෛනිකව විවෘත පරිසරයට මුදා හැරීම. |